# පැස්කල් ක්‍රමලේඛන භාෂාව

## පුනරීක්ෂණ

01. ක්‍රමලේඛ භාෂාවක් තුල අරාවන් භාවිතා කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

02. අරාවක ලක්ෂණ නම් කරන්න.

03. පැස්කල් භාෂාවේදී ඒකමාන අරාවක් අර්ථ දක්වන ආකාරය ලියන්න.

04. පූර්ණ සංඛ්‍යාත්මක අගයන් 5ක් ඇතුලත් කලහැකි Numbers නම් වූ අරාව පැස්කල් කේත ඛණ්ඩයක් ලෙස ලියන්න.

05. ඔබ විසින් අර්ථදක්වන ලද Numbers නැමැති අරාවට පහත සඳහන් සංඛ්‍යාත්මක අගයන් අනුපිළිවෙලින් පැවරීම සඳහා අදාල පැස්කල් ක්‍රමලේඛ ඛණ්ඩය ලියන්න.

06. පහත සඳහන් සංසිද්ධි සඳහා අරාවන් භාවිතා කර පැස්කල් ක්‍රමලේඛ ලියන්න.

- සිසුන් 20 දෙනෙකුගේ තොරතුරු තාක්ෂණ ලකුණු ICT නැමැති අරාවට ඇතුලත් කිරීම.
- ඔබ නිවසේ සාමාජිකයන්ගේ වයස (අවුරුදු) Age නැමැති අරාවට ඇතුලත් කිරීම.

07. නිර්මාණය කරනලද අරාවක අගයන් ප්‍රකාශයට පත් කිරීම සිදු කල හැක. ඔබ විසින් ඉහත ප්‍රශ්ණයේදී නිර්මාණය කරන ලද ICT සහ Age නැමති අරාවන් දෙක සඳහා පහත විස්තර ලබාගැනීමට අදාල පැස්කල් ක්‍රමලේඛ ඛණ්ඩයන් ලියන්න.

- ICT නැමැති අරාවේ පස්වන සිසුවාගේ සිට පහලොස්වන සිසුවා දක්වා ඔවුන්ට අදාල ලකුණු ප්‍රකාශයට පත් කිරීම.
- ICT නැමැති අරාවේ 5, 10, 15 යන අවයව වල අගයන් ප්‍රකාශයට පත් කිරීම.
- Age නැමැති  අරාවේ පලමු සාමාජිකයාගේ සහ අවසාන සාමාජිකයාගේ වයස වෙන වෙනම ප්‍රකාශයට පත් කිරීම.